**WWW.WSWS.org**

**ලෝක සමාජවාදී වෙබ් අඩවිය**

**හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය**

# රජයේ සියලු ව්‍යාපාර පුද්ගලීකරනය කරන ලෙස වික්ටර් අයිවන් ආන්ඩුවට උපදෙස් දෙයි

**ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි**

**2016 අගෝස්තු 29**

රාවය පත්‍රයේ හිටපු කතෘ සහ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනගේ හා අගමැති රනිල් වික්‍රමසිංහගේ ආන්ඩුව බලයට ගෙන ඒමට දරදිය ඇදි මාධ්‍යවේදීන් ගේ නඩයේ ප්‍රමුඛයෙකු වන වික්ටර් අයිවන් ආන්ඩුවේ ගමන් මග මැයින් අගෝස්තු 21 රාවයට ලියූ ලිපියක කඩිනම් මහ මැතිවරනයක් මගින් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ විපක්ෂයට විරුද්ධව අත ශක්තිමත් කර ගැනීමට අසමත්වීම, "රටට ඔරොත්තු නොදෙන තරමේ සහන රැසක් ලබාදීම" හා "මනෝරාජික ප්‍රතිසංස්කරන" ගැන ආන්ඩුවට චෝදනා කරන අතර රාජ්‍ය ව්‍යාපාර මුලුමනින් ම පුද්ගලීකරනය කල යුතු යැයි යෝජනා කරයි.

රටට ඔරොත්තු නොදෙන "මනෝරාජික ප්‍රතිසංස්කරන"යනුවෙන් අයිවන් සඳහන් කරන්නේ මැතිවරන ගුන්ඩුවක් ලෙස රාජ්‍ය අංශයේ සේවකයන්ට රුපියල් 10,000 දීමනාවක් දීම හා පොහොර සහනාධාරය කප්පාදු කර අඩුමිල පොහොර වෙනුවට මූල්‍ය සහනාධාරයක් ගොවීන්ට දීම ගැනය. මීට ඉහත දී ඔහු පොහොර සහනාධාරය කප්පාදුවට විරුද්ධව පන නැගුන උද්ඝෝෂන වලට කඩා පනිමින් සහනාධාර මත "යැපීම" ගැන ගොවීන්ට දෝෂාරෝපනය කලේ ය.

මෙවර ඔහු රාජ්‍ය ආයතන පුද්ගලීකරනය කිරීමේ අවශ්‍යතාවය හා හදිසිභාවය අවධාරනය කරමින් මෙසේ ලියයිඃ "ව්‍යාපාර කිරීම ව්‍යාපාරිකයන්ගේ කාර්යයක් මිස රජයේ කාර්යයක් නොවේ. ....රජය ව්‍යාපාර පවත්වාගෙන යන ප්‍රතිපත්තියෙන් අත්මිදී රජයේ සියලු ව්‍යාපාර පුද්ගලික අංශයට විකුනන ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නේ නම් එම ව්‍යාපාර විකිනීමෙන් රජයට ලැබෙන ආදායම හේතු කොටගෙන ආන්ඩුව මුහුන දී තිබෙන ආර්ථික දුෂ්කරතා ලිහිල් කිරීමට හේතුවනු ඇති අතර පුද්ගලික අංශයේ විශාල වර්ධනයක් ඇති කරන්නට හේතුවී රටේ ලොකු ආර්ථික වර්ධනයක්ද ඇතිවනු ඇත්තේය."

අයිවන් යෝජනා කරන රාජ්‍ය ආයතන පුද්ගලීකරනය රාජ්‍ය වියදම් කපා හැරීම සහ අයවැය පරතරය අඩුකිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නිර්දේශිත ආර්ථික ප්‍රතිසංස්කරනවල කොටසකි. මුහුන දී සිටින දැවැන්ත නය හා මූල්‍ය අර්බුදයේ බර කම්කරුවන් හා දුගීන් මත පැටවීම සඳහා ආන්ඩුව රාජ්‍ය ආයතන පුද්ගලීකරනය සහ නිදහස් අධ්‍යාපනය, සෞඛ්‍යය, ගොවි සහනාධාර ඇතුලු මහජන සුභසාධනයන් කපා දැමීම ක්‍රමානුකූලව ක්‍රියාවට දමන්ට පටන් ගෙන ඇත. අගමැති වික්‍රමසිංහගේ පස් අවුරුදු ආර්ථික සැලැස්මට මෙම ආර්ථික ප්‍රතිසංස්කරන හා කප්පාදු පිලිවෙත් අඩංගුය.

එයාර් ලංකා, ලංකා හොස්පිටල්, හිල්ටන් හෝටලය ඇතුලු රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන හතක් පුද්ගලික අංශයට පැවරීම ආන්ඩුව දැනටමත් නිවේදනය කර තිබේ. ලංගම, වරාය හා ධීවර සංස්ථාවේ ශ්‍රම බලකාය දහස් ගානකින් කප්පාදු කිරීමට සහ ලංකා විදුලි බල මංඩලය හා තෙල් සංස්ථා ප්‍රතිව්‍යූහකරනය ද ඒ සමග ක්‍රියාවට දැමෙයි. එහෙත් මතු වී ඇති මහජන විරුද්ධත්වය හා පැටලී ඇති බරපතල දේශපාලන අර්බුදය මැද අපේක්ෂා කරන තරම් කඩිනමින් එම සැලසුම් ක්‍රියාවට දමා ගැනීමට සිරිසේන -වික්‍රමසිංහ ආන්ඩුව අසමත් වී තිබේ.

අයිවන් කනස්සල්ලට පත්ව සිටින්නේ ආර්ථික ප්‍රතිසංස්කරන ඍජුව ක්‍රියාවට දැමීමට ආන්ඩුව අසමත්වීම සම්බන්ධයෙනි. ඒ සඳහා ආන්ඩුවට "නිර්භීතභාවය" සහ "අධිෂ්ඨානශීලීභාවය" තිබිය යුතු යැයි ඔහු කියයි. "ඒ ගුනාංගය තමන් තුල ඇති බව පෙන්වීමට යහපාලන ආන්ඩුවේ නායකයන් ප්‍රමානවත් තරමින් සමත් වී නැත" යි චෝදනා කරන ඔහු "මේ විෂයේදී ජනාධිපතිවරයා හා අගමැතිවරයා දරන අදහස්වල ලොකු පරස්පරයක් තිබෙන බව පැහැදිලිව පෙනෙන්නට තිබේ. ජනාධිපතිවරයා කියන්නේ ලාභ ලබන රජයේ ආයතන පුද්ගලික අංශයට පවරන ප්‍රතිපත්තියකට තමන් ඉඩ නොදෙන බවය. පෞද්ගලිකකරන ප්‍රතිපත්තියකදී ඉහල මිලක් ලබාගත හැක්කේ ලාබ ලබන ව්‍යාපාරවලින් මිස පාඩු ලබන ව්‍යාපාරවලට නොවේ" යයි ලියා ඇත.

පුද්ගලීකරනයට එරෙහිව කම්කරු පන්තියෙන් මතුව ඇති විරෝධය නිසා ලාභ ලබන රාජ්‍ය ආයතන පුද්ගලීකරනය

කරන්නේ නැතයි ජනාධිපති සිරිසේන කියා ඇත. ඒ කම්කරු පන්තියේ ඇසට වැලිගසා නොමග යැවීමේ දේශපාලන උප්පර වැට්ටියක් මිස පුද්ගලීකරන සැලසුම් ක්‍රියාවට නොදමන බවට සහතිකයක් නම් නො වේ. සිරිසේන-වික්‍රමසිංහ ආන්ඩුව කැපවී සිටින්නේ කම්කරු පන්තියේ විරෝධය මැද රාජපක්ෂ ආන්ඩුව සම්පූර්න කිරීමට අසමත් වූ මහජන විරෝධී ආර්ථික ප්‍රතිසංස්කරන ක්‍රියාවට දැමීමටය.

අයිවන් රාජ්‍ය ආයතන පුද්ගලීකරනය කිරීම සාධාරනීකරනය කිරීමට තැත් කරන්නේ "රජයේ සේවය දේශපාලන අරමුනින් රක්ෂා ලබාදෙන ප්‍රධාන මාර්ගයක් බවට පත්වී" තිබීම හා "ඒ මගින් රජයේ සේවයේ ඇතිවී තිබෙන ප්‍රසාරනය රටට ඉසිලිය නොහැකි ලොකු බරක්" බවට පත්වීමත් එය රටේ ශ්‍රම ඵලදායකත්වය ද දුර්වල කරන සාධකයක් බවට පත්වී" තිබේය යන චෝදනා මතු කරමිනි. පුද්ගලීකරනය හා කප්පාදු පිලිවෙත් ක්‍රියාවට දැමීම සධාරනීකරනය කිරීම සඳහා අයිවන් අඹරන ප්‍රති -ගාමී තර්ක හා ධනපති පාලක පන්තියත්, එය වටේ රැලිවී සිටින මධ්‍යම පන්තික බුද්ධිමතුනුත් අඹරන තර්කත් අතර වෙනසක් නැත.

බලයේ පැවති හැම ආන්ඩුවක් ම, විශේෂයෙන් ම පසු ගිය දසක අතර තුල කම්කරු පන්තියේ රැකියා හා ජීවන තත්වයන් ට පහරදීමේ දී යොදා ගත්තේ මේ කුතර්කයන් ය. එමෙන් ම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කප්පාදු නියමයන් ක්‍රියාවට දැමීමෙන් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට හැකිය යන්න ද පචයකි.

ලංකාවේ ධනපති ආර්ථික අර්බුදයේ මූලය වන්නේ ගැඹුරුවන ලෝක ධනවාදයේ අර්බුදය යි. මේ හැම පාර්ශවයක් ම යට ගසන මූලික කාරනය එයයි. ලෝක ධනපති ක්‍රමයේ දැන් දිග හැරෙමින් පවතින අර්බුදය 1930 වලින් මෙපිට එය මුහුන දුන් දැවැන්ත ම අර්බුදය වේ. ධනපති ක්‍රමයේ පද්ධතිගත අර්බුදයක් වන එය දියුනු -නොදියුනුකම නොතකා ලෝකයේ හැම රටක් ම අලලා ගෙන ඇත.

ලෝකයේ හැම රටකම ධනපති පාලක පන්තීන් මෙම අර්බුදයෙන් ගොඩ ඒමට උත්සාහ කරන්නේ වැඩකරන ජනතාවගේ රැකියා වැටුප් හා ජීවන තත්වයන්ට පහර දෙමින් අර්බුදයේ බර කම්කරු පන්තිය මතට රුදුරු ලෙස කඩා පාත් කිරීමෙනි. පුද්ගලීකරනය හා සමාජ සුබසාධන කප්පාදුව එහි කොටසකි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිර්දේශ මත ආන්ඩුව ක්‍රියාවට දමන්නේ ඒ වැඩ පිලිවෙලයි. අයිවන් පෙල ගැසී සිටින්නේ එම වැඩ පිලිවෙල සමගයි. ඔහුගේ කෝපය මහජන විරෝධය මැඩ, ඇති තරම් වේගයෙන් එය ක්‍රියාවට දැමීමට සිරිසේන-වික්‍රමසිංහ ආන්ඩුව අසමත්වීම ගැනය.

ජනතා විරෝධී ආර්ථික ප්‍රතිසංස්කරන ක්‍රියාවට දැමීමේ දී "රටේ පවත්නා ජනප්‍රිය මතය තිබෙන යථාර්ථයන්ට පටහැනි විය හැකිය. එවැනි අවස්ථාවලදී මහජන මතයට ගරු කල යුතුයැයි කියන ජනප්‍රිය මතයට මුවාවී තීන්දු ගැනීම කල්මරන ප්‍රතිපත්තියක් රටේ යහපතට හේතුවන්නේ නැත." යි ඔහු ආන්ඩුවට උපදෙස් දෙයි.

"එවැනි අවස්ථාවල වියයුත්තේ මහජනයාට කරුනු පැහැදිලි කරමින් මහජනයා නිවැරදි මතයට හරවා ගැනීමය" යැයි ඔහු යෝජනා කරයි. "කරුනු පැහැදිලි කිරීම" යනුවෙන් අයිවන් අදහස් කරන්නේ ධනවාදී අර්බුදයේ බරට කම්කරු-පීඩිත ජනතාව කර ගැසිය යුතුය යන ප්‍රචාරය උත්සන්න කිරීමයි. ඒ වනාහි දෘෂ්ටිවාදාත්මකව සහ දේශපාලනිකව මහ ජනයා නොමග යැවීමේ සූත්‍රයකි. ධනපති ආන්ඩුව සහ මාධ්‍ය සංස්ථාපිතය එය නො අඩුව කරති. අයිවන් ද ඊට හවුල්වී සිටියි.

අයිවන් සැබවින්ම උනන්දු ඒ ගැන නොවේ. රැකියා, වැටුප් හා ජීවන තත්වයන් ට එල්ල කෙරෙන ප්‍රහාර වලට එරෙහිව කම්කරු පීඩිත ජනයාගේ බරපතල සමාජ අරගල පැන නැගීම මෙම ප්‍රචාර නොතකා වර්ධනය වන්ට පටන් ගෙන ඇත. ඒවා බිඳීම සඳහා සිරිසේන-වික්‍රමසිංහ ආන්ඩුව පොලිස් රාජ්‍ය විධික්‍රම යොදා ගැනීමට පටන් ගෙන ඇත.

එහෙත් අයිවන්ට පෙනෙන්නේ ආන්ඩුව කාල්ගාන බවකි. "අධිෂ්ඨානශීලිභාවයක" හා "නිර්භීතභාවයක" අවශ්‍යතාවය ගැන ඔහු කරන අවධාරනයේ තේරුම වන්නේ කම්කරු-පීඩිත ජනයාගේ විරෝධය කුඩු කරමින් පුද්ගලීකරනය ඇතුලු ආර්ථික ප්‍රතිසංස්කරන ක්‍රියාවට දැමීමට ආන්ඩුව වහවහා පොලිස් රාජ්‍ය විධික්‍රම යොදා ගනිමින් කඩා පැනිය යුතු බවයි. නැතහොත් සමාජ පිපිරීම් ඉහවහා යනු ඇතැයි අයිවන් බියපත්ව සිටියි. ඔහු ප්‍රකාශයට පත් කරන්නේ සිරිසේන බලයට ගෙන ඒමට ඇමරිකානු අධිරාජ්‍යවාදය සමග පෙල ගැසුනු ඉහල මධ්‍යම පන්තික නඩයක උවමනාව යි.

© www.wsws.org